# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2114/49 - 2019 මාර්තු මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2019.03.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින් මෙහි උපලේඛනයෙහි I, II හා III වන තීරුවල නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සෑම අනුරූපී භාණ්ඩයක් මතම, ඉහත පනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද 2019 මාර්තු මස 05 දිනැති අංක 2113/9 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ I වන උපලේඛනයෙහි අනුරූප භාණ්ඩ මත එම උපලේඛනයේ IV වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති බදු අනුප්‍රමාණයන් සඳහා, මෙහි උපලේඛනයෙහි IV වැනි තීරුවෙහි දක්වා ඇති නිෂ්පාදන බදු අනුප්‍රමාණයන් 2019 මාර්තු මස 15 දින සිට ප්‍රතිස්ථාපනය විය යුතු බව, ප්‍රකාශයට පත් කරමි.

මංගල සමරවීර,<br>
මුදල් අමාත්‍ය.

2019 මාර්තු මස 14 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් අමාත්‍යාංශයේ දී ය.


1A - PG 4446 — 567 (2019/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය<br>I | සංයෝජිත වර්ගීකරණ සංකේතය<br>II | විස්තරය<br>III | නිෂ්පාදන බද්ද<br>IV |
|---|---|---|---|
| **87.03** | | **(87.02 ශීර්ෂයේ ඒවා හැර), ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව ප්‍රධාන වශයෙන් පුද්ගලයන් ප්‍රවාහනය කිරීම සඳහා සැළසුම් කරන ලද මෝටර් කාර් සහ අනෙකුත් මෝටර් වාහන.** | |
| | | | |
| | 8703.80 | අනෙකුත් වාහන, ඉදිරියට පැදවීම සඳහා විදුලි මෝටරයක් පමණක් සහිත | |
| | | | |
| | | අනෙකුත්, වාහනයට සවිකරන ලද සූර්ය විදුලි පැනල මගින් උත්පාදනය වන විදුලියෙන් පමණක් ආරෝපනය වන වාහනයට සවිකරන ලද ඇකියුම්ලේටර් වලින් පමණක් බලගැන්වෙන ඃ | |
| | 8703.80.32 | ධාරිතාවය කිලෝ වොට් 50 ඉක්මවන්නාවූ එහෙත් කිලෝ වොට් 100 නොඉක්මවන්නා වූ මෝටර් වාහන | අවුරුද්දකට වඩා නොපැරණි ඒකක සඳහා කිලෝ වොට් එකකට රු. 10,000/- |
| | | | අනෙකුත් ඒකක සඳහා කිලෝ වොට් එකකට රු. 15,000/- |
| | 8703.80.33 | ධාරිතාවය කිලෝ වොට් 100 ඉක්මවන්නාවූ එහෙත් කිලෝ වොට් 200 නොඉක්මවන්නාවූ මෝටර් වාහන | අවුරුද්දකට වඩා නොපැරණි ඒකක සඳහා කිලෝ වොට් එකකට රු. 15,000/- |
| | | | අනෙකුත් ඒකක සඳහා කිලෝ වොට් එකකට රු. 25,000/- |
| | | අනෙකුත්, බාහිර විදුලි ප්‍රභවයකින් (උදා ඃ ජාතික විදුලිබල පද්ධතිය) මගින් ආරෝපනය වන වාහනයට සවිකරන ලද, ඇකියුම්ලේටර් මගින් බලගැන්වෙන සහ වාහනයට සවි කරන ලද ජෙනරේටරය ධාවනය කිරීමෙන් විදුලිය උත්පාදනය කර ගැනීම සඳහාම පමණක් යොදාගත හැකි වී අභ්‍යන්තර දහන එංජිමක් සහිත, වසර තුනකට වඩා නොපැරණි | |
| | | | |
| | 8703.80.52 | ධාරිතාවය කිලෝ වොට් 50 ඉක්මවන්නාවූ එහෙත් කිලෝ වොට් 100 නොඉක්මවන්නා වූ මෝටර් වාහන | අවුරුද්දකට වඩා නොපැරණි ඒකක සඳහා කිලෝ වොට් එකකට රු. 10,000/- |
| | | | අනෙකුත් ඒකක සඳහා කිලෝ වොට් එකකට රු. 15,000/- |
| | 8703.80.53 | ධාරිතාවය කිලෝ වොට් 100 ඉක්මවන්නාවූ එහෙත් කිලෝ වොට් 200 නොඉක්මවන්නා වූ මෝටර් වාහන | අවුරුද්දකට වඩා නොපැරණි ඒකක සඳහා කිලෝ වොට් එකකට රු. 15,000/- |
| | | | අනෙකුත් ඒකක සඳහා කිලෝ වොට් එකකට රු. 25,000/- |
| | | | |
| **87.04** | | **බඩු ප්‍රවාහනය කිරීම සඳහා වූ මෝටර් වාහන** | |
| | 8704.90 | අනෙකුත් ඃ | |
| | | විදුලි බලයෙන් ක්‍රියා කරන අවුරුදු පහකට වඩා නොපැරණි, අනෙකුත් | |
| | 8704.90.33 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 100 ඉක්මවන්නා වූ එහෙත් කිලෝ වොට් 200 නොඉක්මවන්නා වූ මෝටර් වාහන | කිලෝ වොට් එකකට රු. 15,000/- |



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.